# 13 වාක්‍ය රීති I



ශාස්ත්‍රීය ලේඛන ද නිර්මාණාත්මක ලේඛන ද ගොඩ නැගෙන්නේ වාක්‍ය එකිනෙක එක් වීමෙනි. නිවැරදි වාක්‍ය නිවැරදි ලේඛනයට රුකුලකි. ඒ සඳහා වාක්‍ය රීති මැනවින් ප්‍රගුණ කළ යුතු ය. වාක්‍යයක උක්තය හා ආඛ්‍යාතය යනුවෙන් කොටස් දෙකකි. එම කොටස් දෙක අතර ඇති ව්‍යාකරණානුකූල සම්බන්ධතාව උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය යි. එම සම්බන්ධතාව ගොඩ නැගීමට ඉවහල් වන උක්ත පදයේ ලිංග භේදය හා වචන භේදය හඳුනා ගැනීම වාක්‍ය රීති යටතේ ඉතා ප්‍රයෝජනවත් වේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

**සීනුව නාද විය.** ළමයි පේළි සැදී ප්‍රධාන ශාලාව ඉදිරිපිටට රැස් වූහ. එදින පාසලේ උදේ රැස්වීම මෙහෙයවීම භාරව තිබුණේ 8 ශ්‍රේණියේ සිසු දරුදැරියන්ට ය. ආගමික වතාවත්වලින් අනතුරුව **විදුහල්පතිතුමා සිසුන් ඇමතුවේ ය.**

ඉන් පසුව එදිනට අදාළ **විශේෂාංග ඉදිරිපත් විය.** එහි දී 8 ශ්‍රේණියේ **ශිෂ්‍යාවෝ ගීතයක් ගායනා කළහ; ශිෂ්‍යයෝ කෙටි නාට්‍යයක් රඟ දැක්වූහ.** සිසුන්ගේ දක්ෂතා අගය කරමින් කතා කළ පන්ති භාර **ගුරුතුමිය සිසුන්ට තෑගි පිරිනැමුවා ය.**

මේ ඡේදවල ඇතුළත් පහත දැක්වෙන පද දෙස බලන්න.

| | | |
|---|---|---|
| සීනුව | ළමයි | ශාලාව |
| රැස්වීම | විදුහල්පතිතුමා | විශේෂාංග |
| ශිෂ්‍යාවෝ | ගීතයක් | ශිෂ්‍යයෝ |
| නාට්‍යයක් | දක්ෂතා | ගුරුතුමිය |
| තෑගි | පේළි | සිසුන් |

සාමාන්‍යයෙන් මේ පද හැඳින්වෙන්නේ නාම පද ලෙස ය. එහෙත් නාම පදවල ස්වරූපය හා ඒවා යෙදෙන ආකාරය අනුව නාම පද විවිධ නම් ලබයි. ඒ පිළිබඳ දැන ගැනීම නිවැරදි වාක්‍ය ලිවීමේ දී ඔබට ප්‍රයෝජනවත් වෙයි.

## • ලිංග භේදය

ලිංග භේදයට අනුව නාම පදයක් පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග හෝ නපුංසක ලිංගයට අයත් වෙයි.

### පුරුෂ ලිංග නාම පද

ළමයි, විදුහල්පතිතුමා, ශිෂ්‍යයෝ යන පිරිමි අර්ථයක් පළ කරන පද පුරුෂ ලිංග හෙවත් පුරුෂවාචී නාම පද වෙයි.

### ස්ත්‍රී ලිංග නාම පද

ගුරුතුමී, ශිෂ්‍යාවෝ යන පද ස්ත්‍රී අර්ථයක් හඟවන නිසා ස්ත්‍රී ලිංග හෙවත් ස්ත්‍රීවාචී නාම පද වෙයි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## නපුංසක ලිංග නාම පද

ඉහත ඡේදයේ ඇතුළත් සීනුව, ශාලාව, ගීතයක්, තෑගි, පේළි ආදි අප්‍රාණවාචී බවක් හඟවන නාම පද නපුංසක ලිංග හෙවත් අචේතන ගණයේ නාම පද වෙයි.

### ලිඛිත අභ්‍යාස

1. **පහත සඳහන් නාම පද සුදුසු පරිදි යොදා දී ඇති වගුව සම්පූර්ණ කරන්න.**

   ඇතා, පොත්, ස්ත්‍රිය, කුරුල්ලන්, පෙට්ටිය, මැණියෝ, ඇස, බල්බය, වලසුන්, ලේඛකයා, දුම්රිය, කපුටෝ, සෙබළුන්, සිසුවිය, වැව්, කිඹුල්ලු, දූවරුන්, තාප්පය, මහියා, නිලධාරිනිය, සේවිකාව, ගම, කවීකයා, කම්කරුවන්, ඇතින්න, සිරුර, නැන්දා, අක්කලා, මුද්දර

| පුරුෂ ලිංග නාම පද | ස්ත්‍රී ලිංග නාම පද | නපුංසක ලිංග නාම පද |
|---|---|---|
| | | |

ඉහත ඡේදයේ තද කළු අකුරින් දැක්වෙන පහත වාක්‍ය විමසා බලන්න.

**සීනුව** නාද විය.

**විශේෂාංග** ඉදිරිපත් විය.

**විදුහල්පතිතුමා** සිසුන් ඇමතුවේ ය.

**ගුරුතුමිය** සිසුන්ට තෑගි **පිරිනැමුවා** ය.

**ශිෂ්‍යාවෝ** ගීතයක් ගායනා කළහ.

**ශිෂ්‍යයෝ** කෙටි නාට්‍යයක් රඟ දැක්වූහ.

ඒ වාක්‍යවල උක්ත වශයෙන් යෙදී ඇති **සීනුව, විශේෂාංග** යන පද අප්‍රාණවාචී බවක් ද, **විදුහල්පතිතුමා, ශිෂ්‍යයෝ** යන පද පුරුෂවාචී බවක් ද **ගුරුතුමිය, ශිෂ්‍යාවෝ** යන පද ස්ත්‍රීවාචී බවක් ද හඟවයි. ඒ අනුව වාක්‍යවල ආඛ්‍යාතයේ (අවසාන ක්‍රියා පදයේ) වෙනසක් තිබේ දැයි සසඳා බලන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

නපුංසක ලිංගයට අයත් **සීනුව, විශේෂාංග** යන පද අතරින් සීනුව යන්නෙන් එකක් හැඟවෙන අතර විශේෂාංග යන්නෙන් එකකට වඩා වැඩි බව හඟවයි. එහෙත් ඒ වෙනස අනුව වාක්‍යයේ අවසාන ක්‍රියාව වෙනස් වී නැත.

ස්ත්‍රී ලිංගයට අයත් **ගුරුතුමිය** යන පදය හා පුරුෂ ලිංගයට අයත් **විදුහල්පතිතුමා** යන පදය සමග යෙදී ඇති අවසාන ක්‍රියා පිළිවෙළින් **පිරිනැමුවා ය, ඇමතුවේ ය** වේ. ඒවායේ ස්වරූපය උක්ත පදයේ ලිංග භේදය අනුව වෙනස් වී ඇති බව ඔබට පැහැදිලි වනු ඇත.


**ශිෂ්‍යාවෝ** යන පදය ස්ත්‍රී ලිංගයට ද **ශිෂ්‍යයෝ** යන පදය පුරුෂ ලිංගයට ද අයත් වන නමුත් ඒවා සමග යෙදුණු අවසාන ක්‍රියා පදයේ ස්වරූපය එකී ලිංග භේදය පදනම් කර ගෙන වෙනසකට භාජනය වී නැති බව ද පැහැදිලි ය.

මේ කරුණු විමසා බැලීමේ දී පෙනී යන්නේ වාක්‍යයක් සකස් වීමේ දී ලිංග භේදය පමණක් නො ව ඒක වචන, බහු වචන භේදය ද බලපාන බව යි. ඒ පිළිබඳ තව දුරටත් විමසා බලමු.


ඡේදයෙන් උපුටා ගත් පහත වචන ගොනු විමසන්න.

සීනුව, රැස්වීම, ශාලාව, විදුහල්පතිතුමා, ගුරුතුමිය, ගීතයක්

ළමයි, පේළි, වතාවත්, සිසුන්, විශේෂාංග, දක්ෂතා, ශිෂ්‍යාවෝ, ශිෂ්‍යයෝ, තෑගි



**පැරණි ව්‍යාකරණය අනුව නපුංසක ලිංග ලෙස හැඳින්වුණේ අප්‍රාණවාචි හෙවත් අචේතන ගණයේ නාම පද යි. සිංහල භාෂාවේ ලිංග භේදයක් දැකිය හැක්කේ ප්‍රාණවාචි නාමයන්හි ය. එනම් ස්ත්‍රී ලිංග, පුරුෂ ලිංග වශයෙනි. වර්තමානයේ ප්‍රාණවාචි පද පමණක් ඒ යටතේ වර්ගීකරණය කෙරෙන අතර අප්‍රාණවාචි පද ලිංග භේදය යටතේ වර්ගීකරණය නො කෙරෙයි. ප්‍රාණවාචි හෙවත් සචේතන සහ අප්‍රාණවාචි හෙවත් අචේතන යන වර්ගීකරණයට අනුව අචේතන ගණයට ඇතුළත් කෙරෙනුයේ පැරණි ව්‍යාකරණයේ නපුංසක ලිංග ලෙස හැඳින්වුණු නාම යි.**






නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# වචන භේදය

ඒක වචන හා බහු වචන වශයෙන් නාම පද කොටස් දෙකකි.

## ඒක වචන නාම පද

**ගුරුතුමිය** යන පදයෙන් එක් කෙනකු ද **සීනුව** යන පදයෙන් එක් දෙයක් ද කියවෙන බැවින් ඒවා ඒක වචන නාම පද යි.

## බහු වචන නාම පද

**ශිෂ්‍යයෝ** යන පදයෙන් එක් කෙනකුට වැඩි දෙනකු ද, **විශේෂාංග** යන පදයෙන් එක් දෙයකට වැඩි දෙයක් ද හැඟවෙන බැවින් ඒවා බහු වචන නාම පද යි.

පහත දැක්වෙන පද ඇසුරෙන් ඒක වචන හා බහු වචන භේදය තවදුරටත් හඳුනා ගත හැකි ය.

| ඒක වචන නාම පද | බහු වචන නාම පද |
|---|---|
| දක්ෂයා | දක්ෂයෝ |
| ඇතා | ඇත්තු |
| ගැහැනිය | ගැහැනු |
| රට | රටවල් |
| තෑග්ග | තෑගි |

## ලිඛිත අභ්‍යාස

1. හිස් තැන්වලට සුදුසු ඒක වචන පද හෝ බහු වචන පද හෝ යොදා පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | ඒක වචන | බහු වචන | | ඒක වචන | බහු වචන |
|---|---|---|---|---|---|
| 1 | මිනිසා | මිනිස්සු | 11 | ............................... | කුඹුරු |
| 2 | ශිෂ්‍යයා | ............................... | 12 | ගස | ............................... |
| 3 | ............................... | උගරෝ | 13 | ............................... | ශබ්ද |
| 4 | කම්කරුවා | ............................... | 14 | ගෙය | ............................... |
| 5 | ............................... | ගුරුවරු | 15 | කථාව | ............................... |
| 6 | ............................... | නරඹන්නෝ | 16 | ............................... | මෝස්තර |
| 7 | ව්‍යාඝ්‍රයා | ............................... | 17 | හැන්ද | ............................... |
| 8 | ............................... | සිසුවියෝ | 18 | ............................... | සාප්පු |
| 9 | ඉබ්බා | ............................... | 19 | කෝච්චිය | ............................... |
| 10 | ............................... | පරිසරවේදීහු | 20 | මුද්ද | ............................... |

වාක්‍යයක ක්‍රියාව හා සම්බන්ධ වන පදයේ ලිංග භේදය හා වචන භේදය අනුව ක්‍රියා පදයේ ස්වරූපය ද වෙනස් වෙයි. පහත සඳහන් නිදසුන් දෙස බැලීමෙන් එය හඳුනා ගත හැකි ය.

ශිෂ්‍යයා ගීයක් ගයයි.
ශිෂ්‍යාව ගීයක් ගයයි.
**ශිෂ්‍යයා ගීයක් ගැයුවේ ය.** (අතීත කාලය)
**ශිෂ්‍යාව ගීයක් ගැයුවා ය.** (අතීත කාලය)
ශිෂ්‍යයෝ ගී ගයති.
ශිෂ්‍යාවෝ ගී ගයති.
ශිෂ්‍යයෝ ගී ගැයූහ/ගැයුවෝ ය.
ශිෂ්‍යාවෝ ගී ගැයූහ/ගැයුවෝ ය.
**ශිෂ්‍යයා ගීයක් ගයන්නේ ය.** (අනාගත කාලය)
**ශිෂ්‍යාව ගීයක් ගයන්නී ය** (අනාගත කාලය)
ශිෂ්‍යයෝ ගී ගයන්නාහ/ගයන්නෝ ය.
ශිෂ්‍යාවෝ ගී ගයන්නාහ/ගයන්නෝ ය.

අතීත කාලයෙහි හා අනාගත කාලයෙහි ක්‍රියාපදවල දක්නට ලැබෙන වෙනස ද නිවැරදි වාක්‍ය ලිවීමේ දී සැලකිල්ලට ගත යුතු වෙයි.

## ලිඛිත අභ්‍යාස

1. **කොටුවෙහි සඳහන් වචන ගැළපෙන අදහසක් ඇති වන පරිදි හිස් තැන්වලට යොදා නිවැරදි වාක්‍ය ගොඩ නගන්න.**

> රියැදුරෝ, අශ්වයා, නංගී,
> සරුංගලය, ගුවන් යානය,
> උකුස්සෝ,ගොවියෝ, වරදකරුවන්,
> නාහිමියෝ, අපි

i. ................................ කවියක් කීවා ය.
ii. ................................ අහසෙහි ලෙළ දෙයි.
iii. ................................ කුඹුර වපුරති.
iv. ................................ ගුවන් තොටුපළට ළඟා විය.
v. ................................ වේගයෙන් දුවන්නේ ය.
vi. ................................ පොත් පාඩම් කරමු.
vii. ................................ දහම් දෙසති.
viii. ................................ වාහන නතර කළහ.
ix. ................................ ඉහළ අහසෙහි පියාඹති.
x. ................................ පොලීසියට හසු වූහ.

2. **පහත දැක්වෙන ක්‍රියා පද යොදා වාක්‍යය බැගින් තනන්න.**

> බලති, කියවයි, වෙත්වා, කීවා ය,
> කළේ ය, දල්වයි, නැරඹීමි, නැටුවෝ ය,
> වැටෙයි, වඩිති.